// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1969/57 - 2016 ජුනි මස 03 වැනි සිකුරාදා - 2016.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 08/2016

**(417 වැනි අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත**

(417 වැනි අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2009 ජුනි මස 24 වැනි දින සහ අංක 1607/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගවල 9 වැනි නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (1) වැනි ඡේදය, ''මහ බැංකුව වෙනුවෙන් (417 වැනි අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ පත්කරන ලද රාජ්‍ය ණය ලේඛකාධිකාරී විසින්'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනත ප්‍රකාරව පත් කරන ලද මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (2) වැනි ඡේදයේ, ''රාජ්‍ය ණය ලේඛකාධිකාරී'' යන වචන වෙනුවට ''බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා'' යන වචන ආදේශ කිරීමෙන්.

06 - 636